# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1957/23 - 2016 මාර්තු මස 11 වැනි සිකුරාදා - 2016.03.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### ශ්‍රී ලංකා මහ බැංකු නිවේදන

**විනිමය පාලන පනත යටතේ දැන්වීම**

**(ලංකා ව්‍යවස්ථාදායක ප්‍රඥප්ති සංග්‍රහයේ 423 වන අධිකාරය)**

**විනිමය පාලන පනතේ 7, 11, 22(1) සහ 30(5) වන වගන්ති ප්‍රකාර අවසරය**

විනිමය පාලන පනතේ (ලංකා ව්‍යවස්ථාදායක ප්‍රඥප්ති සංග්‍රහයේ 423 වන අධිකාරය) 7 හා 11 වගන්ති සහ 22 වගන්තියේ (1) වන උපවගන්තිය හා 30 වගන්තියේ (5) වන උපවගන්තිය අනුව පැවරී ඇති බලතල ප්‍රකාරව, පහත සඳහන් පුද්ගල කාණ්ඩයන් හට, ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරනු ලැබූ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර මිලදී ගැනීම, පැවරීම හා ගෙවීම් කිරීම සඳහාත්, එකී පුද්ගල කාණ්ඩයන් විසින් හෝ එකී පුද්ගල කාණ්ඩයන් හට බැඳුම්කර අපනයනය කිරීම සඳහා ද මෙමගින් අවසර ප්‍රදානය කරනු ලැබේ.

(i) 1923 අංක 8 දරන දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත සහ 1937 අංක 7 දරන ලියාපදිංචි ස්කන්ධ සහ සුරැකුම් ආඥාපනත යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පත් කරන ලද ප්‍රාථමික වෙළෙඳුන්;

(ii) ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික, විදේශීය රාජ්‍යයන් හි පුරවැසියන්;

(iii) ශ්‍රී ලංකාවෙන් පිටත තම නිත්‍ය වාසස්ථානය කර ගත් ශ්‍රී ලාංකික පුරවැසියන්;

(iv) වෘත්තියක හෝ ව්‍යාපාරයක නියැලීම හෝ රැකියාවක් කරගෙන යාම සඳහා ශ්‍රී ලංකාවෙන් බැහැරව ගොස් සිටින ශ්‍රී ලාංකික පුරවැසියන්;

(v) ශ්‍රී ලංකාව හැර වෙනත් රටක නීතිය යටතේ සංස්ථාගත කළ හෝ සංස්ථාගත නොකළ ආයතනයන්;

(vi) 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත යටතේ ශ්‍රී ලංකාව තුළ රක්ෂණ ව්‍යාපාර කරගෙන යාම සඳහා ලියාපදිංචි කරන ලද සමාගම් ; කෙසේ වුව ද මෙම රක්ෂණ සමාගම් විසින් සිදු කරන සියළු ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර මිලදී ගැනීම් විනිමය පාලක විසින් දී ඇති අනුමැතිය ප්‍රකාරව එකී රක්ෂණ සමාගම් විසින් වාණිජ බැංකුවක පවත්වාගෙන යනු ලබන විශේෂ විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක් හර කිරීමකින් සිදු කළ යුතු ය;

(vii) අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්, නේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්, නේවාසික විජාතික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හා විදේශ විනිමය උපයන්නන්ගේ ගිණුම් හිමියන්;

(viii) විනිමය පාලන පනතේ 4 වන වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් පත් කරන ලද බලයලත් වෙළෙඳුන්;

(ix) විදේශ ව්‍යවහාර මුදලින් තැන්පතු භාර ගැනීම සඳහා අවසරලත් බලපත්‍රලාභී විශේෂිත බැංකු සහ බලපත්‍රලාභී මූල්‍ය සමාගම්;

(x) ශ්‍රී ලංකාවෙන් පිටත තම නිත්‍ය වාසස්ථානය කරගෙන ඇති බවට සනාථ කළහැකි, ද්විත්ව පුරවැසිභාවය සහිත ශ්‍රී ලාංකික පුරවැසියන්.

රජයේ (අතිවිශෙෂ) ගැසට් පත්‍රයන් හි පළ කරන ලද 2001 නොවැම්බර් 11 දිනැති අංක 1208/14 දරන නිවේදනය හා 2008 ජූලි 23 දිනැති අංක 1559/16 දරන නිවේදනය මෙමගින් අවලංගු කෙරේ.

ටී. එම්. ජේ. වයි. පී. ප්‍රනාන්දු,
විනිමය පාලක.

2016 මාර්තු මස 11 වැනි දින,
ශ්‍රී ලංකා මහ බැංකුව,
කොළඹ දී ය.

04-388


1A - G 23186 — 26 (2016/03)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.